
## කැමරා ඇස ගිය තැන්

# වසර 1200 කට කලින් මුහුදුබත් වූ අද්භූත නැවක්




නැව් මුහුදුබත් වීම නැව් භාවිතයට පැමිණි මුල් කාලයේ පටන්ම සිදුවූවක්. මින් බොහොමයක් නොදන්නා නැව්. ප්‍රචලිත කථා ඇත්තේ දන්නා නැව් පිළිබඳවයි. ටෙක්සාස් හි A and M (ඒ ඇන්ඩ් එම්) සරසවියේ නාවික පුරාවිද්‍යා ආයතනයේ ෆ්‍රෙඩ් හොකර් ඇතුළු පිරිස මෑතකදී කැනීම් කටයුතු සිදුකොට ඇත්තේ මෙවන් නැවකයි.

මේ නැව දැනට වසර 1200 කට පමණ ඉහතදී මුහුදුබත් වූවක්. එහි ගමනාරම්භක වරාය හෝ ගමන්නාන්තය මෙතෙක් හෙළි වී නැහැ. නටඹුන් තුළින් හමුවූ ඉවුම් - පිහුම් උපකරණ හා වෙනත් දේ මගින් පර්යේෂකයෝ තීරණය කොට ඇත්තේ, මෙය කාර්ය මණ්ඩලය අටදෙනෙකු ගෙන් සමන්විත නැවක් වූ බවයි. මේ නැවෙන් තවත් අපූරු දේ හමුවී තිබෙනවා. ඒ වයින් පුරවා තිබූ මැටි බඳුන් 1500 ක්. මේ මැටි බඳුන් සමහරක වෙළෙඳුන්ගේ නම් කොටා තිබෙනවා. ඒ ඔවුන් වෙනුවෙන්ම යම් පෙදෙසකින් ගෙන ආ ඒවා විය හැකියි.

මේ නැවේ සුන්බුන් අතරින් මුල් කාලීන වීදුරු කාර්මිකයින් විසින් යන්ත්‍ර සූත්‍ර භාවිත නොකර සැකසූ (Hand blown) විදුරු බෝතල් ද හමු වී තිබෙනවා. එමෙන්ම ඉතා අගනා වීදුරු කෝප්පවල (වයින් වීදුරු වැනි) සුන්බුන් සමූහයක් ද හමුවී තිබෙනවා. ඉන් එකක් පමණක් දැනට පිළිසකර කොට ඇතත් අර්ධ වශයෙන් රූපයේ දැක්වෙන්නේ එසේ පිළිසකර කරමින් පවතින වීදුරු කෝප්පය හා නැවේ සුන්බුන් අතර ගවේෂණ කටයුතු සිදුකරන පර්යේෂකයින්. මේ මැටි බඳුන්වල ස්වරූපයන් සලකා බැලූ විද්‍යාඥයින් පවසන්නේ කළු මුහුද ආශ්‍රිත ක්‍රිමියා දූපත්වලින් මේ මැටි භාණ්ඩ ගෙන එන්නට ඇති බවයි. මේ කාල වකවානුවේ මැටි පෝරණු තිබී ඇත්තේ මේ ප්‍රදේශයේ බව මීට පෙර ගවේෂණ මගින් හෙළිවී තිබෙනවා.

# දිවෙන් දඩයම් කරන සැලමන්දරා



සත්ව ලෝකයේ ඇත්තේ අපූර්ව චර්යාවන්. ඒවා විටින් විට සොයා ගැනෙනවා. ඇතැම් ඒවා මීට පෙර කියපු-දැකපු දේවල් වුනත් සුවිශේෂ අපූර්වත්වයක් ඒ තුළින් ඉස්මතු වනවා.

ගෙම්බන්ගේ නැත්නම් ඇම්ෆිබියා වර්ගයේ සතුන්ගේ භෝජන විලාසය මෙවන් සුවිශේෂ අවස්ථාවක්, ඔවුන්ගේ දිව සම්බන්ධව ඇත්තේ මුඛයේ ඉදිරි කෙළවරට, ක්ෂීරපායින් වන මිනිසුන්ගේ මෙන් මුඛයේ පිටුපස කෙළවරට නොවෙයි. ඉතින් ඔවුන් තමන්ගේ දිව ක්ෂණයකින් ඉවතට විසිකරන්නේ එහි තම ගොදුර පටලවා මුඛය තුළට ගැනීමටයි. දිවෙහි ඇති ඇලෙනසුලු ගතිය නිසා ගොදුරට ගැලවීමේ හැකියාවක් ලැබෙන්නේ නැහැ.

රූපයෙහි දැක්වෙන්නේත් ඇම්ෆිබියා වර්ගයට (උභයජීවී වර්ගයට) අයත් සැලමන්දරෙක්. මේ සැලමන්දරා හඳුන්වන්නේ ගුහා සලමන්දරා වශයෙන්. අඟල් 2.5 ක් පමණ දිගකින් යුත් මේ සැලමන්දරාට අඟල් 2 ක් පමණදිගකින් යුත් දිවක් තිබෙනවා. සියලු සැලමන්දරයන් අතරින් දිගම දිවක් ඇත්තේ මේ ගුහා සැලමන්දරාටයි. දිවේ ඇති ඉතා ප්‍රබල පේශී නිසා උන්ට මෙසේ තම දිව මෙහෙයවිය හැකි බවයි විද්‍යාඥයෝ පවසන්නේ. අනෙක් අතට මේ දිව මුඛයට සම්බන්ධව ඇත්තේ අමතර කාටිලේජ ඇති අස්ථි මගින් නිසා මේ "දඩයම" පහසුවෙන් කර ගැනීමේ හැකියාව ගුහා සැලමන්දරාට ලැබී තිබෙනවා.

# මුහුදු තරණයේ යෙදුණු මුල් කාලීන මානවයෝ



**මුල් කාලීන මානවයින් මිහිපිට ඇවිදගිය අයවළුන් වශයෙන් ප්‍රකටයි. ඒ සඳහා ඇත්තේ නොබිඳිය හැකි සාක්ෂි. එහෙත් මුල් කාලීන මානවයින් - එනම් Homo erectus විශේෂයේ මානවයින් - මුහුදු ගමන්වලත් යෙදුණු බව සනාථ කෙරෙන සාක්ෂ්‍ය දැන් ලැබී තිබෙනවා. හෝමෝ ඉරෙක්ටස් මානවයින් භාවිත කළ පතුරු ආයුධ ඉන්දුනීසියානු දූපත් ආශ්‍රිතව හමු වී තිබෙනවා. මේ ආයුධ දැනට වසර ලක්ෂ 8-9 අතර කාලයේදී භාවිත වූ ඒවා. මේ ආයුධ පිළිබඳව අදහස් දක්වන ඕස්ට්‍රේලියාවේ නිව් ඉන්ග්ලන්ඩ් සරසවියේ පුරාවිද්‍යාඥ මයික් මෝර්වුඩ් පවසන්නේ හෝමෝ ඉරෙක්ටස් මානවයින්ගේ ව්‍යාප්ත ප්‍රදේශ සැලකූවිට ඉන්දුනීසියානු දූපතක් වන ෆ්ලෝස් වෙත පැමිණීමට ඔවුන්ට තිබූ එකම මාර්ගය මුහුද හරහා මේ දූපත් වෙතට යාත්‍රා කිරීම පමණක් බවයි.**






මේ තිබෙන්නේ මමියක්. ඊජිප්තුවේ පාරාවෝ රජෙක් වූ ii වැනි රැම්සස් පාරාවෝ රජුගේ සුරක්ෂිත කොට තැබූ දේහයයි මේ. වසර 3000 කට වඩා පැරණි මේ මමිය දැනට කයිරෝහි පිහිටි ඊජිප්තු කෞතුකාගාරයේ තබා තිබෙනවා.

ii වැනි රැම්සස් සුවිශේෂ පාරාවෝ වරයෙක්. වසර 66 ක් රජ කළ මේ රජුට බොහෝ බිරින්දෑවරු සිටි බවයි කියවෙන්නේ. අනෙක් පාරාවෝ වරයින්ට වඩා වැඩියෙන් පූජනීය ස්ථාන තැනූ රජෙක් වශයෙන් ii වැනි රැම්සස් ප්‍රකටයි.

# කෘමීන් සොහොන්ගත කළ ඇම්බර්

ඈත කාලයේ විසූ ශාක වර්ගයකින් ස්‍රාවය වූ මැලියම් විශේෂයක් (රෙසින සංයෝග) පාෂාණීභූත වීමෙන් නිර්මාණය වූ සුවිශේෂ ද්‍රව්‍යයක් වශයෙන් ඇම්බර් හැඳින්විය හැකියි. ලෝකයේ ඇතැම් ප්‍රදේශවලින් පැණි පැහැති කැට වශයෙන් මේ ඇම්බර් මතුවනවා.



පුරාවිද්‍යාඥයින්ට ඉතා වැදගත් මෙහෙයක් ඇම්බර් මඟින් ඉටුවනවා. මේ මැලියම්වල එකල විසූ කෘමි විශේෂ ඇලී යාමෙන් ඔවුන් ඒ තුළ "සොහොන්ගත" වී සිටිනවා. විද්‍යාඥයින්ට එකල විසූ කෘමීන් පිළිබඳව මින් ලැබෙන්නේ අමිල පිටුවහලක්.

ඇම්බර් ආශ්‍රිත පර්යේෂණ සිදුකරන ප්‍රමුඛ පෙළේ පර්යේෂකයෙක් වන්නේ ස්වාභාවික ඉතිහාසය පිළිබඳ ප්‍රංශ කෞතුකාගාරයේ ජීන් ජාකොස්. මෙතෙක් සොයාගත් ඇම්බර් රාත්තල් 660 ක් පමණ ඔවුන්ගේ පර්යේෂණයන්ට ලක්ව තිබෙනවා. මීට වසර මිලියන 53 කට පෙර කාලයේ විසූ කෘමීන් පවා මේ ඇම්බර් තුළ සිරවී සිටින බවයි ඔහු පවසන්නේ.

කුඩා ප්‍රමාණයේ ඇම්බර් කැටවල සිට ටෙනිස්බෝලයක් තරම් විශාල ඇම්බර් කැට හමුවී තිබෙනවා. ජීන් ජාකොස් සමඟ මේ පර්යේෂණවලට සම්බන්ධ වී සිටින අන්ද්‍රේ නෙල් පවසන්නේ ඔහු මෙවන් ඇම්බර් ආශ්‍රිත කෘමීන් 10 000 ක් පමණ අධ්‍යයනය කොට තිබෙන බවයි. ඉන් ලැබෙන දත්ත පුරාතන යුගයේ හැඩරුව විස්තර කෙරෙන අපූරු සාධක ආන්ද්‍රේ නෙල් පවසන්නේ මින් කෘමි විශේෂ 200 ක් ම නව විශේෂයන් වශයෙන් හඳුනාගත් බවයි. මේ අතර තවත් අපූරු සිද්ධියක් වාර්තා වනවා. ඇම්බර් තුළ පුරාතන ශාක කොටස් ද සිරවී සුරක්ෂිතයව තිබෙන බවයි ඒ.

ආදි කාලීන ජීවීන්ගේ රුව-ගුණ විස්තර කෙරෙන ඇම්බර් කැටයක් රූපයේ දැක්වෙනවා. එහි සිරවී සිටින්නේත් කෘමියෙක්.

# නෑදෑයෝ

කුඩා පිරිමි ළමයෙක් තවත් කුඩා ගැහැනු ළමයෙකුගෙන් තමා කසාද බැඳීමට කැමැතිදැයි ඇසුවේය.

"මට කතගාටුයි ළමයෝ,"

ඈය උත්තර දුන්නාය

"අපේ පවුලේ අය ඔක්කොමලා කසාද බඳින්නේ පවුලේම නෑදෑයෝ. මගේ තාත්තා මගේ අම්මා කසාද බැන්ද. මගේ සීයා මගේ ආච්චි කසාද බැන්ද. මගේ මාමා මගේ නැන්ද කසාද බැන්ද."

**රචනය - සොම්නාත් කාකෙරා**

**අනුවාදය - පරාක්‍රම ඇස්. විජේවර්ධන**